# 4 ශ්‍රේණිය සිංහල

## පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු

## 11 ඒකකය - 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 11 ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ

තේරවිලි කියවා රසවිඳීමටත්, ඒවා විසඳීමටත් බොහෝ දෙනා කුඩා කල සිට කැමැත්තක් දක්වති. විවේකය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හා විනෝදයට අතීතයේ දී තේරවිලි භාවිත කර ඇත. ඒවා පරිසරය පිළිබඳ දැනුම මෙන් ම භාෂා දැනුම වර්ධනය කර ගන්නට ද උදවු වෙයි.

තේරවිලි වර්ග කිහිපයක් තිබේ. සරල තේරවිලි, තුන් තේරවිලි, පද පෙරළි, තේරවිලි කවි වශයෙනි.



සරල තේරවිලි තෝරා පිළිතුරු සොයා ගැනීම පහසු ය. තේරවිල්ලට හොඳින් සවන් දී පිළිතුරු ලබා දීම මෙහි දී සිදු වේ. **නූල් බැඳි අහස් යානාව** යන්න සරල තේරවිල්ලකි.

මෙහි පිළිතුර කුමක් විය හැකි ද? අහස් යානාව ගුවනේ ගමන් කරයි. එයට නූල් බඳින්නේ නැත. එසේ නම් නූල් මගින් අහසේ පා කරන්නේ කුමක් ද? මේ කියන්නේ සරුංගලය ගැනයි.

තුන් තේරවිලි ද තවත් තේරවිලි වර්ගයකි. ඉදිරිපත් කරන තේරවිල්ල පියවර තුනක දී විසඳා අවසන් පිළිතුර ලබා ගැනීම මෙහි දී සිදු කෙරෙයි.

**ගොහොරු වේල්ල** තුන් තේරවිල්ලකි. එය,

ගොහොරු නම් **මඩ**

වේල්ල නම් **කණ්ඩිය**

මඩ කණ්ඩිය - **කඩ මණ්ඩිය** ලෙස පිළිතුර ලැබේ.



මේ සඳහා වචන පිළිබඳ දැනුමත් පද පෙරළීමේ කුසලතාවත් තිබිය යුතු ය.

**ගජනාළය** ද තුන් තේරවිල්ලකි.

ගජ නම් **ඇත්**

නාළය නම් **බටය**

ඇත් බටය - **බත් ඇටය**



පද හතරකින් යුත් තේරවිලි කවි තවත් තේරවිලි වර්ගයකි. ඒවා තාලයකට ගායනා කළ හැකි ය. එබඳු ඇතැම් තේරවිලි කවිවලට


පිළිතුරු කවි ද ඇත. පහත දැක්වෙන්නේ එබඳු තේරවිලි කවියකි.

**තේරවිලි කවිය**

ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මග වැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

**පිළිතුරු කවිය**

ටිං ටිං ගාන්නා ලේනා නොවේ දෝ
ටං ටං ගාන්නා ගෝණා නොවේ දෝ
මග වැලි පිසින්නා කුකුළා නොවේ දෝ
දෙගම්බඩ රජා කිඹුලා නොවේ දෝ



සතුන්ගේ හඬ, ගමන් කරන ආකාරය, හැසිරීම් රටා ආදිය පිළිබඳ අවබෝධය ඉහත තේරවිල්ලෙහි පිළිතුර සොයා ගැනීමට උපකාරි වෙයි.

මේ එවැනි තවත් තේරවිල්ලකි.

**තේරවිලි කවිය**

ඉණේ තිබෙන ලිය තෝරා එවාපන්
ගෙදර තිබෙන ලිය තෝරා එවාපන්
ගසේ තිබෙන ලිය තෝරා එවාපන්
අතු අග තිබෙන ලිය තෝරා එවාපන්

**පිළිතුරු කවිය**

ඉණේ තිබෙන ලිය හැඟිලිය නොවේ දෝ
ගෙදර තිබෙන ලිය ඇතිළිය නොවේ දෝ
ගසේ තිබෙන ලිය හෙරලිය නොවේ දෝ
අතු අග තිබෙන ලිය අරලිය නොවේ දෝ

සිතීමේ හැකියාව දියුණු කර ගැනීමට තේරවිලි උපකාර වේ. අතීතයේ මෙන් ම වර්තමානයේ ද තේරවිලි නිර්මාණය වෙයි. ඔබටත් විනෝදජනක ක්‍රීඩාවක් ලෙස තේරවිලි ඉදිරිපත් කිරීම හා විසඳීම යොදා ගත හැකි ය. අලුත් තේරවිලි නිර්මාණය ද අපූරු අද්දැකීමක් වනු ඇත.

# 04 ශ්‍රේණිය සිංහල 11 ඒකකය
# ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ



Online Class Details (2022) Hasitha Hettiarachchi WhatsApp 071-9020298

තේරවිලි කියවා රසවිඳීමටත්, ඒවා විසඳීමටත් බොහෝ දෙනා කුඩා කල සිට කැමැත්තක් දක්වති. විවේකය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හා විනෝදයට අතීතයේ දී තේරවිලි භාවිත කර ඇත. ඒවා පරිසරය පිළිබඳ දැනුම මෙන් ම භාෂා දැනුම වර්ධනය කර ගන්නට ද උදවු වෙයි.-

- **අවබෝධය**

❖ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.

1. තේරවිලි වර්ග තුනක් නම් කරන්න.

.......................................................................................................................

2. පියවර තුනක දී විසඳා අවසන් පිළිතුර ලබා ගත හැකි තේරවිලි වර්ගය කුමක් ද?

.......................................................................................................................

3. නිවැරදිව යා කරන්න.

| | |
|---|---|
| ඉණේ තිබෙන ලිය | ඇතිළිය |
| ගෙදර තිබෙන ලිය | හැඹිලිය |
| ගසේ තිබෙන ලිය | අරලිය |
| අතු අග තිබෙන ලිය | හෙරලිය |



4. පහත දක්වා ඇත්තේ අලුතෙන් නිර්මාණය කරන ලද තේරවිලි කවියකි. එයට සුදුසු පිළිතුරු කවියක් නිර්මාණය කරන්න.

ඉගෙනුම ලබන සල තෝරා එවන්නේ
සිතුවම් අඳින සල තෝරා එවන්නේ
අකුරු ලියන සල තෝරා එවන්නේ
රජුන් විසූ සල තෝරා එවන්නේ

.......................................................................................................................
.......................................................................................................................
.......................................................................................................................
.......................................................................................................................

## තේරවිලි

- කියවීම් පොතේ ඇතුළත් ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ පාඩමෙහි ඇතුළත් පහත සඳහන් තේරවිලි තුන් තේරවිලි සහ තේරවිලි කවි වලට අදාළ පිළිතුරු ලියන්න.

1. නූල් බැඳි අහස් යානාව - ......................................

2. උඩහ ගෙදර මම යනකොට - අඟුර දඟර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි - නොතේරුවොත් ටොකු විස්සයි.

......................................

3. ගොහුරු වේල්ල

ගොහුරු නම් ........................ වේල්ල නම් .............................

...................................... කඩමණ්ඩිය

4. ගජනාලය

ගජ නම් ............................. නාලය නම් ...................................

...................................... බත් ඇටය

5. ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මඟ වැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

ටිං ටිං ගාන්නා ........................ නොවේ දෝ

ටං ටං ගාන්නා ........................ නොවේ දෝ

මඟ වැලි පිසින්නා ........................ නොවේ දෝ

දෙගම්බඩ රජා ........................ නොවේ දෝ

6. ඉණේ තිබෙන ලිය තෝරා එවාපන්
ගෙදර තිබෙන ලිය තෝරා එවාපන්
ගසේ තිබෙන ලිය තෝරා එවාපන්
අතු අග තිබෙන ලිය තෝරා එවාපන්

ඉණේ තිබෙන ලිය ........................ නොවේ දෝ

ගෙදර තිබෙන ලිය ........................ නොවේ දෝ

ගසේ තිබෙන ලිය ........................ නොවේ දෝ

අතු අග තිබෙන ලිය ........................ නොවේ දෝ

- ක්‍රියාකාරකම 1

1. කණ්ඩායම්වලට බෙදී තේරවිලි තරගයක් පවත්වන්න.

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

# පිළිතුරු



Answer



# 04 ශ්‍රේණිය සිංහල 11 ඒකකය
# ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ

Online Class Details (2022) Hasitha Hettiarachchi WhatsApp 071-9020298

තේරවිලි කියවා රසවිඳීමටත්, ඒවා විසඳීමටත් බොහෝ දෙනා කුඩා කල සිට කැමැත්තක් දක්වති. විවේකය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හා විනෝදයට අතීතයේ දී තේරවිලි භාවිත කර ඇත. ඒවා පරිසරය පිළිබඳ දැනුම මෙන් ම භාෂා දැනුම වර්ධනය කර ගන්නට ද උදවු වෙයි.-

- අවබෝධය

❖ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.

1. තේරවිලි වර්ග තුනක් නම් කරන්න.

සරල තේරවිලි, තුන් තේරවිලි, පද පෙරළි, තේරවිලි කවි

2. පියවර තුනක දී විසඳා අවසන් පිළිතුර ලබා ගත හැකි තේරවිලි වර්ගය කුමක් ද?

තුන් තේරවිලි

3. නිවැරදිව යා කරන්න.

| | |
|---|---|
| ඉණේ තිබෙන ලිය | ඇතිළිය |
| ගෙදර තිබෙන ලිය | හැඹිලිය |
| ගසේ තිබෙන ලිය | අරලිය |
| අතු අග තිබෙන ලිය | හෙරලිය |

(යා කළ පිළිතුරු: ඉණේ තිබෙන ලිය → හැඹිලිය; ගෙදර තිබෙන ලිය → ඇතිළිය; ගසේ තිබෙන ලිය → හෙරලිය; අතු අග තිබෙන ලිය → අරලිය)



4. පහත දක්වා ඇත්තේ අලුතෙන් නිර්මාණය කරන ලද තේරවිලි කවියකි. එයට සුදුසු පිළිතුරු කවියක් නිර්මාණය කරන්න.

ඉගෙනුම ලබන සල තෝරා එවන්නේ
සිතුවම් අඳින සල තෝරා එවන්නේ
අකුරු ලියන සල තෝරා එවන්නේ
රජුන් විසූ සල තෝරා එවන්නේ

ඉගෙනුම ලබන සල තෝරා ........ පාසල නොවේ දෝ
සිතුවම් අඳින සල තෝරා ........ පින්සල නොවේ දෝ
අකුරු ලියන සල තෝරා ........ පෑන්සල නොවේ දෝ
රජුන් විසූ සල තෝරා ........ වාසල නොවේ දෝ

## තේරවිලි

- කියවීම් පොතේ ඇතුළත් ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ පාඩමෙහි ඇතුළත් පහත සඳහන් තේරවිලි තුන් තේරවිලි සහ තේරවිලි කවි වලට අදාළ පිළිතුරු ලියන්න.

1. නූල් බැඳි අහස් යානාව - ......සරුංගලය......

2. උඩහ ගෙදර මම යනකොට - අඟර දඟර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි - නොතේරුවොත් ටොකු විස්සයි.

......කරවිල......

3. ගොහුරු වේල්ල

ගොහුරු නම් ......මඩ.......... වේල්ල නම් කණ්ඩිය..............

......මඩ කණ්ඩිය...... කඩමණ්ඩිය

4. ගජනාලය

ගජ නම් ......ඇත්............ නාලය නම් ......බටය..................

......ඇත් බටය........ බත් ඇටය

5. ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මඟ වැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

ටිං ටිං ගාන්නා ......ලේනා...... නොවේ දෝ
ටං ටං ගාන්නා ......ගෝණා...... නොවේ දෝ
මඟ වැලි පිසින්නා ......කුකුළා...... නොවේ දෝ
දෙගම්බඩ රජා ......කිඹුලා...... නොවේ දෝ

6. ඉණේ තිබෙන ලිය තෝරා එවාපන්
ගෙදර තිබෙන ලිය තෝරා එවාපන්
ගසේ තිබෙන ලිය තෝරා එවාපන්
අතු අග තිබෙන ලිය තෝරා එවාපන්

ඉණේ තිබෙන ලිය ........හැඹිලිය නොවේ දෝ
ගෙදර තිබෙන ලිය ....ඇතිලිය..... නොවේ දෝ
ගසේ තිබෙන ලිය ........හෙරලිය නොවේ දෝ
අතු අග තිබෙන ලිය ....අරලිය...... නොවේ දෝ

- <u>ක්‍රියාකාරකම 1</u>

1. කණ්ඩායම්වලට බෙදී තේරවිලි තරගයක් පවත්වන්න.

කපන්න කපන්න දික් වෙනවා - කාණුව, පාර

ආවට පස්සේ ආපසු යන්නේ නැහැ - මහලු කම

කොණ්ඩය ඇති අයත් නැති අයත් ළඟ තිබිය යුතු පනාව - කල්පනාව

ගමක නමකි අට අකුරෙන් යෙදෙන්නේ
මෙලක තැනකි පද තුනකින් හැදෙන්නේ
මුලට රජෙකි අග නිවසකි සඟුන්නේ
කිමෙක මෙසකි කිව හැකි දැයි බලන්නේ
- තිස්සමහාරාමය

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ